# ප්‍රතිපත්ති සාරාංශය: ශ්‍රී ලංකාවේ ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 2021-2030ආහාර හා



## පෝෂණ සුරක්ෂිතතාව: වෙළඳ අංශය කුමක් කළ යුතු ද?

පෝෂණය, සංවර්ධනයේ නිමැවුම්කරුවෙකු ලෙස ද දර්ශකයක් ලෙස ද තිරසාර සංවර්ධන ඉලක්කවලට මූලික පදනම සකසයි. දෙවන තිරසාර සංවර්ධන ඉලක්කය වන කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාව, වැඩි දියුණු වූ පෝෂණය ළඟා කර ගැනීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය අරමුණු කර ඇත. වෙළඳ අංශය, ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව ළඟා කර ගැනීමට අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් පරිපූර්ණ ප්‍රතිපත්ති මාලාවක අනිවාර්ය අංගයක් වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය, ආහාර මිල උද්ධමනයට සහ ජනතාවට සාමාන්‍ය පරිදි ජීවත්වීමට බාධා පමුණුවා ඇති අතර, මේ හේතුවෙන් ගෘහ ඒකකවල මිලදී ගැනීමේ හැකියාව අඩු වීම නිසා ඔවුනට මිලෙන් අඩු හා සෞඛ්‍යයට අහිතකර විකල්ප ආහාර වෙත යොමු වීම, ආහාර ප්‍රමාණය හෝ ආහාර වේල් ගණන අඩු කිරීම වැනි උපාය මාර්ග අනුගමනය කිරීමට සිදුව ඇත.

දෙවන තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට, මනා ක්‍රියාකාරීත්වයෙන් යුත් ආහාර වෙළඳපොළක් සහතික කරනු ලබන බහුවිධ ප්‍රවේශයක් (multifaceted approach) අවශ්‍ය වේ. වෙළඳපළ තොරතුරු වලට වැඩි දියුණු ප්‍රවේශයක් ලබා දීම සහ අපනයන සහනාධාර ඉවත් කිරීම හරහා වෙළඳපල විකෘති කිරීම් වැළැක්වීම මගින් මිල උච්චාවචනයන් අඩු කිරීම හෝ සීමා කිරීම මීට අයත්ය.



ආහාරවල මිල අනපේක්ෂිත ලෙස උච්චාවචනය වීම සීමා කිරීම සඳහා ආහාර සහ ඒවායේ නිෂ්පාදන වෙළඳපොළ මනා ක්‍රියාකාරීත්වය සහතික කිරීමට සහ ආහාර සංචිත ඇතුළුව වෙළඳපොළ තොරතුරු වෙත නිසිකළ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීමට ක්‍රියාමාර්ග අනුගමනය කිරීම

**ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව** සඳහා උචිත උපාය මාර්ග අනුගමනය කිරීමට වෙළඳ අංශය සතු භූමිකාව

**පෝෂණ සංවේදී ආහාර අගය දාමය ඔස්සේ උසස් ගුණාත්මක බවින් යුතු හා සෞඛ්‍ය සම්පන්න ආහාරවල සුලභතාව හා එම ආහාරවලට ඇති ප්‍රවේශය ඉහළ නැංවීම**

- ආහාර සැපයුම් දාමය කළමනාකරණය (උසස් තත්ත්වයේ ආහාර නිෂ්පාදනය, පසු අස්වනු හානිය අඩු කිරීම, ආහාර ස්වෛරීත්වය) සම්බන්ධයෙන් අදාල සියළු පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම
  - ආහාර හානිය අඩු කිරීමට ආහාර ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ පද්ධති වැඩි දියුණු කළ යුතුය.පෝෂණ අවදානම් සහිත ජන කොට්ඨාසවලට අතිරික්ත ආහාර බෙදා හැරීමට ආහාර බැංකු (food banks) ස්ථාපිත කිරීම, කාර්යක්ෂම ප්‍රවාහන ජාල සැකසීම සහ ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම
- මහජන ආදායම්, බදු හා තීරු බදු ප්‍රතිපත්ති ඇති කිරීම
- ස්ථාවර ආහාර සැපයුම සහතික කිරීමට මෙන්ම ආහාර හිඟතාවයන් වැළැක්වීමට ද විශේෂයෙන්, නියං කාලවලදී හෝ අනෙකුත් අයහපත් කාලගුණික තත්ත්වවලදී ධාන්‍ය, පියළි ඇට සහ ශාකමය තෙල් වර්ග ආනයනයට පහසුකම් සැලසීම

**ආරක්ෂිත ආහාර සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීමට නෛතික රාමුව සඳහා සහය වීම**

- වීදි ආහාර මෙන්ම ක්ෂණික ආහාර ද ඇතුළුව ජනතාව අධික ලෙස පරිභෝජනය කරනු ලබන සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පිළිබඳ අවධානය යොමු කරමින් ආහාර ආරක්ෂණය හා ප්‍රමිතීන් සම්බන්ධයෙන් අවශ්‍ය නීති හඳුන්වාදීම හෝ සමාලෝචනය සහ සංශෝධනය කිරීම
- දැනට පවතින හා අළුතින් සැකසූ නීති බලාත්මක කිරීම ශක්තිමත් කිරීම
- ළමුන් සඳහා සෞඛ්‍යයට අහිතකර ආහාර ප්‍රවර්ධනය කිරීම නියාමනය කිරීමට පෝෂක පැතිකඩ ආකෘතිය ද (Nutrition Profile Model) ඇතුළුව දැනට පවතින යාන්ත්‍රණ ක්‍රියාවට නැංවීම ක්‍රමවත් කිරීම
- ශක්තිමත් නීති යාන්ත්‍රණයක් මගින් ආචාර ධර්මවලට පටහැනි වෙළඳාම පාලනය කිරීම
- ළදරුවන් හා කුඩා ළමුන් අරමුණු කර ගනිමින් නිපදවා ඇති විශේෂිත කිරිපිටි වර්ග, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, වාණිජ වශයෙන් සකසා ඇති ආහාර හා පාන වර්ග නියාමනය කිරීමට දැඩි නීති ක්‍රියාවට නැංවීම

- ආහාර නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, හසුරවන්නන් සහ පාරිභෝගිකයින් අතර, රෙගුලාසි ද ඇතුළත්ව ආහාර සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත්බව වැඩි කිරීම

**රටේ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ස්ථාවර කිරීම සහ සියළුම පුරවැසියන් සඳහා තත්ත්වයෙන් උසස් හා සෞඛ්‍ය සම්පන්න ආහාර මිලදී ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා;**

- ආහාරවල මිල උච්චාවචනය වීම සීමා කිරීමට තීරණ ගැනීම සඳහා සහය වන තොරතුරු පද්ධති (නිෂ්පාදනය, ප්‍රවණතා, දේශගුණික සාධක වැනි ) සම්බන්ධීකරණය කිරීම
- සෞඛ්‍ය සම්පන්න ආහාරවල මිල පාලනය
- සෞඛ්‍යයට අහිතකර ආහාරවලින් අය කර ගන්නා බදු වැඩි කිරීම